සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - I, II

නම/විභාග අංකය : ........................................................................ කාලය : පැය 03 යි.

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. ජනතා නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ,

1. ප්‍රංශ විප්ලවයෙනි. 2. ඉංග්‍රීසි විප්ලවයෙනි.
3. රුසියන් විප්ලවයෙනි. 4. චීන විප්ලවයෙනි.

02. ඉඩම් භුක්තිය හා බැඳුණු සේවාවන් සැපයීම මත පදනම් වූ කෘෂි ආර්ථික රටාව දැකිය හැකි වූ සමාජ ක්‍රමය වන්නේ,

1. ලිබරල් වාදයයි. 2. ධනවාදී පාලනයයි.
3. වැඩවසම් ක්‍රමයයි. 4. පාර්ලිමේන්තු ක්‍රමයයි.

03. ක්‍රි.පූ 6 වන සියවස පමණ වන විට සමූහාණ්ඩු පාලනයක් පැවති ඉන්දීය ජනපදය කුමක් ද?

1. වජ්ජි 2. මගධ 3. මත්ස්‍ය 4. අංග

04. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියලු දෙනාම සම්බන්ධ වූ ඇතැන්ස් නගර රාජ්‍යය අයත් රට වන්නේ,

1. රෝමයයි. 2. ග්‍රීසියයි. 3. ක්‍රීටයයි. 4. ප්‍රංශයයි.

05. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ඇතැම් රටවල් භාවිතා කරන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය වන්නේ,

1. ජනමත විචාරණය 2. සරල බහුතර නියෝජනය
3. සමානුපාතික නියෝජනය 4. වාර්ගික නියෝජනය

06. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1. අන්‍ය මත ගරු කිරීම. 2. සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම.
3. සමානාත්මතාව ගරු කිරීම. 4. සමාජ සධාරණත්වය පිටු දැකීම.

07. ශ්‍රී ලංකාවට සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කරනු ලැබුවේ,

1. මැකලම් ආණ්ඩු ක්‍රමයෙනි. 2. සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙනි.
3. කෝල්බෲක් ආණ්ඩු ක්‍රමයෙනි. 4. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙනි.

08. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාවේ සඳහන් ජනතාව කෙරෙහි පිහිටා ඇති බලය හැඳින්වෙන්නේ,

1. ආධිපත්‍යය යනුවෙනි. 2. ඒකාධිපත්‍යය යනුවෙනි.
3. ස්වාධිපත්‍යය යනුවෙනි. 4. පරමාධිපත්‍යය යනුවෙනි.

09. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,

1. මහා බ්‍රිතාන්‍යය 2. ඇමෙරිකා එක්සත් ජනපදය
3. කියුබාව 4. ඔස්ට්‍රේලියාව

10. ශ්‍රී ලංකාව බෙදා ඇති මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව,

1. 22 කි. 2. 23 කි. 3. 24 කි. 4. 25 කි.

11. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ,

1. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.
2. ප්‍රාදේශීය පාලනයට නායකයන් පත්කර ගැනීම.
3. දේශපාලන පක්ෂ ක්‍රමයක් පවත්වා ගෙන යාම.
4. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කර ගැනීම.

12. ශ්‍රී ලංකිකයකුට සාර්ව ජන ඡන්ද බලය හිමි වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකමක් වන්නේ,

1. රජයේ රැකියාවක නිරත වීම. 2. වයස අවුරුදු දහඅට සම්පූර්ණ වීම.
3. අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළ යුතු වීම. 4. දේශපාලන අවබෝධයකින් යුතු වීම.

13. 1848 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කිරීමෙන් සිදු වූ වැදගත් ම දේ ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

1. පුද්ගල ජීවිතය පරිපූර්ණත්වයට පත් විණි.
2. සමාන අයිතිවාසිකම් සමාජය තුළ ක්‍රියාවට නැංවුණි.
3. මානව අයිතිවාසිකම් වලට නීතිමය ස්වරූපයක් ලැබුණි.
4. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමට සිදු විණි.

14. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,

1. මහජන මතය නියෝජනය නොවීම. 2. අත්තනෝමතික පාලනයක් බිහි වීම.
3. බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම. 4. ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ සැලසීම.

15. A - නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම.
B - පාලකයින්ට තම අභිමතය පරිදි කටයුතු කළ හැකි වීම.
C - අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම.
D - ආර්ථික ප්‍රතිලාභ සැමට සමාන ව ලැබීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන ඇතුළත් පිළිතුර කුමක් ද?

1. A හා B 2. A හා C 3. B හා D 4. B හා C

16. නීතියේ ආධිපත්‍යය යනුවෙන් අදහස් වන්නේ,

1. රටක සියල්ලන්ට ම ඉහළින් නීතිය පැවතීමයි.
2. සැමොම නීතිය අභිබවා කටයුතු කිරීමයි.
3. පවත්නා නීතියට සැමට දඬුවම් පැමිණ වීමයි.
4. නීතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමයි.

17. රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම ....................................... වගකීම වේ.

1. ආණ්ඩුවේ
2. අධිකරණයේ
3. පොලීසියේ
4. නීතිපතිවරයාගේ

18. ● ව්‍යවස්ථාදායකය තුළින් විධායනය තේරී පත්වේ.
● විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව ඇත.
● ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවක් ඇත.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධවන ආණ්ඩු ක්‍රමය කුමක් ද?

1. රාජාණ්ඩු
2. පාර්ලිමේන්තු
3. ජනාධිපති
4. සමූහාණ්ඩු

19. A හා B ප්‍රකාශ සලකන්න.

A - එක් මාධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශී වී ඇත්තේ ඒකීය රාජ්‍යයන් තුළය.
B - මහජන සුභසාධනයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දී සිදු නොවේ.

1. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
2. A හා B දෙකම අසතය වේ.
3. A හා B දෙකම සත්‍ය වේ.
4. A සත්‍ය වන B අතර අසත්‍ය වේ.

20. සදාචාරාත්මක යුතුකම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. වැඩිහිටියන්ට ගරු කිරීම, පවතින නීතියට ගරු කිරිම.
2. රජයට නියමිත බදු ගෙවීම, සමාජ සිරිත් විරිත් පිළිපැදිම.
3. වැඩිහිටියන්ට ගරු කිරිම, සමාජ සිරිත් විරිත් පිළිපැදිම.
4. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරිම, රජයට නියමිත බදු ගෙවිම.

(ලකුණු 2×20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### පුරවැසි අධ්‍යාපනය - II

නම/විභාග අංකය : ……………………………………………………………

### පුරවැසි අධ්‍යාපනය - II

**සැලකිය යුතුයි :**

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. i. ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලනයට සහභාගී වීමට අවස්ථා නොලැබූ දෙපිරිසක් නම් කරන්න.

ii. ද්වි පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා ජනතා නියෝජිතයන් පත්කර ගැනීමට වර්තමානයේ දී බහුලව භාවිතා කරන නියෝජන ක්‍රම දෙක ලියන්න.

iv. ජාතික රාජ්‍යයක මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න.

v. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතු නීතිමය යුතුකම් දෙකක් ලියන්න.

vi. අතීතයේ සිටම ලෝකයේ පාලනය සඳහා භාවිතා කර ඇති පාලන ක්‍රම දෙකක් නම් කරන්න.

vii. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න.

viii. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දැකිය හැකි විධායකයන් දෙක සඳහන් කරන්න.

ix. වර්තමානයේ දී සමාජ සුභ සාධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

x. ප්‍රජාතන්ත්‍රවාදය ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන බව දැක්වීමට කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2×10=20)

02. "අතීතයේ සිටම ලෝකයේ පෙරදිග රටවල ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය අනුගමනය කර ඇත."

i. ලෝකයේ වර්තමාන පාලනයන් තුළ දී ද දැකිය හැකි සප්ත අපරිහානීය ධර්ම දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ දී ක්‍රියාත්මක නොවීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. A - ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වැදගත් වන ආකාරය දැක්වීමට කරුණු 03 ක් ඉදිරිපත් කරන්න.

B - ඉන් එක් කරුණක් විස්තර කරන්න. (ලකුණු 3+2=5)

03. "ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මැතිවරණ මගින් නියෝජිතයින් පත් කර ගනියි."

i. ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන මැතිවරණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක කර ගැනීමට විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. A - නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් ලියන්න.

B - ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. එක් ජාතියක් වෙනුවෙන් එක් රාජ්‍යයක් යන සංකල්පය මත ජාතික රාජ්‍යයන් බිහි විය.

i. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ජාතික රාජ්‍යය බිහි වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. A - රාජ්‍යයකට පැවරෙන කාර්යයන් තුනක් ලියන්න.
B - ඉන් එක් කාර්යයක් ඉටු කරන ආකාරය ශ්‍රී ලංකාව ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. ''රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන නියෝජිතයා ආණ්ඩුවයි.''

i. නූතන රාජ්‍යවල ක්‍රියාත්මක වන ආණ්ඩු ක්‍රම වල ස්වරූප දෙක ලියන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. A - ආණ්ඩුව සමන්විත වන ආයතන තුන නම් කරන්න.
B - ඉන් එකකින් ඉටුවන කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට විවිධ අයුරින් කටයුතු කළ හැකි වේ.

i. රටක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ සාමකාමී ජන සමාජයක් ගොඩ නැගීමට හේතු වන ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. නිවැරදි ජන මතයක් ගොඩනැගීම සඳහා ජන මාධ්‍ය කටයුතු කළ යුතු ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## පළමු වාර පරීක්ෂණය
## 10 ශ්‍රේණිය - පිළිතුරු
## පුරවැසි අධ්‍යාපනය - I

| | |
|---|---|
| 01 - **2** | 11 - **1** |
| 02 - **3** | 12 - **2** |
| 03 - **1** | 13 - **3** |
| 04 - **2** | 14 - **3** |
| 05 - **1** | 15 - **2** |
| 06 - **4** | 16 - **1** |
| 07 - **4** | 17 - **1** |
| 08 - **4** | 18 - **2** |
| 09 - **3** | 19 - **4** |
| 10 - **1** | 20 - **3** |

**(ලකුණු 2 × 10 = 20)**

## පුරවැසි අධ්‍යාපනය - II

01. i කාන්තාවන්, වහලුන්, විදේශිකයින්
ii. මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එකසත් ජනපදය
iii. සරල බහුතර නියෝජනය, සමානුපාතික නියෝජනය
iv. භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
v. රජයට නියමිත බදු ගෙවීම, පවතින නීතියට ගරු කිර කිරීම, නීතිය හා සාමය ආරක්‍ෂා කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්‍ෂා කිරීම ...........
vi. රාජාණ්ඩු, රදල ආණ්ඩු, ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම
vii. ඒබ්‍රහම් ලින්කන්, සීලර්
viii. දේශපාලන විධායකය/ නාමික විධායකය
ix. සමෘද්ධි සහනාධාර/ වැඩිහිටි දීමනා/ අධ්‍යාපනය, සෞඛ්‍ය ආදි සේවාවන් සඳහා ගෙන ඇති (සිසුන් ඉදිරිපත් කරන සත්‍ය කරුණු සඳහා ලකුණු ලබා දෙන්න.)
x. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම, නිදහස සමානාත්මතාව ගරු කිරීම, අයිතිවාසිම් භුක්ති විදිමින් යුතුකම් ඉටු කිරීම, අන්මත ගරු කිරීම

**(ලකුණු 2 × 10 = 20)**

02.
i. නිතර රැස්වීම, සමගිව සාච්ඡා කිරීම, සමගිව විසිරයාම, නොපැන වූ නීති නොපැන වීම, ............

ii. රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම, අධික ජනගහනයකින් යුක්ත වීම, සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම, එක් ස්ථානයකට රැස්වීමේ අපහසුතාව

iii. මහජන කැමැත්ත මත සිදුවීම, නීති සම්පාදනය බහුතර කැමැත්තක මත සිදුවීම, ආණ්ඩු බලය බහුතර කැමැත්ත මත තෝරා ගත් නියෝජිතයන්ට ලැබීම, ආදිය....

(ලකුණු 2+3+5=10)

03.

i. පාර්ලිමේන්තු මහ මැතිවරණය, පළාත් පාලන ආයතන සඳහා වූ මැතිවරණ, පළාත් සභා මැතිවරණය .....

ii. ආණ්ඩුවේ යහපත් කටයුතු සඳහා සහයෝගය ලබා දීම, සංවර්ධනාත්මක විවේචන මඟින් ආණ්ඩුව සුමඟට යොමු කරීම, ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන්ට විරුද්ධ වීම, වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටු වීමට ක්‍රියා කිරීම.

iii. නියමිත කාල සීමාව තුළ මැතිවරණ පැවැත්වීම, මැතිවරණ නීතිරීති වලට අනුව මැතිවරණ පැවැත්වීම, සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත් වීම...........

(ලකුණු 2+3+5=10)

04.

i. එංගලන්තය හා ප්‍රංශය

ii. පුනරුදය, ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම, රෙපරමදු ආගමික ප්‍රතිසංස්කරණ, විද්‍යාත්මක දැනුම වර්ධනය

iii. නීතිය හා සාමය ආරක්ෂා කිරීම, සමාජ සුභසාධන සේවා පවත්වාගෙන යාම, පොදු සේවා පවත්වා ගෙන යාම, සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම, ආර්ථික දේශපාලන ස්ථාවර බව පත්වා ගෙන යාම.

(ලකුණු 2+3+5=10)

05.

i. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය

ii. විධායක බලය ජනාධිපති විසින් හසුරුවනු ලැබීම, රාජ්‍යයේ මෙන්ම ආණ්ඩුවේ ද නායකයා වීම, විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නොමැති බව

iii. ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
ව්‍යවස්ථාදායකය - නීති සම්මත කිරීම, මුදල් පාලනය, විධායකය පාලනය .........
විධායකය - ව්‍යවස්ථාදායකය පනවන නීති ක්‍රියාත්මක කිරීම
අධිකරණය - යුක්තිය පසඳලීම

(ලකුණු 2+3+5=10)

06.

i. නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම, පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ඇති වීම, අධිකරණයේ සුරක්ෂිත බව ඇති වීම, මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීම .............

ii. නීතියේ අධිපත්‍ය පැවතීම, අධිකරණයේ ස්වාධීනත්වය, බහුතර මතට අනුව කටයුතු කිරීම, සුළුතරයේ අදහස් ගරු කිරීම, සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම.

iii. අපක්ෂපාතීව කටයුතු කිරීම, නිවැරදි තොරතුරු සැපයීම, කාලීන තොරතුරු නිසි වේලාවට සැපයීම ............ ආදිය පැහැදිළි කිරීම.

(ලකුණු 2+3+5=10)